**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

#### (අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පුනරාවර්තන වියදම් ගිණුම් තැබීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වියදම්වල වැඩසටහන් 02 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් දෙකේ මුළු වියදම්වල එකතුව වැය විෂයයක් ලෙස දැක්වීම නිසා භාණ්ඩාගාරයේ මුද්‍රිත සටහන් සමඟ සැසඳීය නොහැකි වී තිබුණි. | භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 271/2019 දරන 2019 දෙසැම්බර් 03 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. භාණ්ඩාගාරය විසින් වැඩිදුර උපදෙස් කිසිවක් ලබාදුන් විට නිවැරදි කරනු ලැබේ. | වැඩසටහන් 02 ක් වන බැවින් වැය විෂයයන් ද වැඩසටහන් ආකාරයට වෙන වෙනම දැක්විය යුතුය. |

#### (ආ) රජයේ නිලධාරීන් සඳහා වූ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විගණනයට ඉදිරිපත් කළ සමාලෝචිත වර්ෂයට අදාළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට සේවය අත්හිටවූ, විශ්‍රාම ගිය සහ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන්ගේ අයවීම් හිඟ හිටව තිබූ එකතුව රු.මිලියන 2.497 ක් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පළාත් සභාවට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ රු.1,703,664ක් නිරවුල් කර ඇත. සේවය අත්හිටවූ නිලධාරීන්ගේ හිඟ ශේෂ රු.251,790ක් ඇපකරුවන්ගෙන් අය කෙරේ. විශ්‍රාම ගිය නිලධාරීන්ගේ හිඟ ශේෂ රු,541,650ක් නිරවුල් කර ඇත. | ආයතන සංග්‍රහයේ XXIV පරිශ්ෂ්ඨයේ 4 වගන්තිය අනුව නිලධාරීන්ගේ හිඟ ණය අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | පළාත් සභාවලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන්ගේ එකතුව රු.1,703,664ක්වූ දෙවර්ෂ ණය සම්බන්ධයෙන් 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.2.1 වගන්තියේ විධිවිධාන අනුව එලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිලධාරීන් දෙදෙනාගේ ණය ශේෂ නිරවුල් කර ඇත. | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.2.1 වගන්තියේ විධිවිධාන අනුව නියමිත කාලය තුළ එලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | සමලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර අත්තිකාරම් ණය සීමා සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අයවැය දෙපාර්තමේන්තුවෙන් අප වෙත ලබාදුන් අත්තිකාරම් ගිණුම්වල උපරිම සීමාව සීමාව සහ අවම සීමාව සැලකිල්ලට ගනිමින් අප විසින් කටයුතු කර ඇත. | අත්තිකාරම් ණය සීමාවන් නිර්නය කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයන් අනුගමනය කිරීමට කටයුතු කකළ යුතුවේ. |

**(ඇ) දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ සමීක්ෂණය කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමෙහි වටිනාකම රු.මිලියන 35 ක් වශයෙන් තක්සේරු කර තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.මිලියන 35 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 03 දිනැති අංක JN/LE/476 දරන ලිපිය ප්‍රකාරව තක්සේරු වටිනාකම ස්ථිර හා අවසාන වටිනාකම නොවන බවත් මෙම ඉඩම අත්පත්කර ගැනීමේ නඩුව සඳහා අධිකරණය තවමත් තීන්දු ප්‍රකාශ කර නොමැති නිසාත් තක්සේරු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. මේ පිළිබඳ තීන්දු ප්‍රකාශයට පත්කළ විට අප විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තක්සේරු කළ ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම පුද්ගලික පාර්ශවයකට අයත්ව තිබුණද එහි වටිනාකම රු.මිලියන 02 මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම්වල දක්වා තිබුණි. එසේම මෙම ඉඩමේ කාර්යාල ගොඩනැගිල්ල රු.මිලියන 58.144 ක වටිනාකමින් ඉදිකර තිබුණද ඉඩමේ අයිතිය පවරා ගැනීමට 2020 ජූනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩමේ අයිතිකරු හඳුනාගත නොහැකිව ඇත. ඒ අනුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ඉහත අයිතිවාසිකම් දක්වා නොමැති ඉඩම පවරා ගැනීම සඳහා ඉල්ලීම් ලිපිය යවා ඇත. | පුද්ගලික ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා ගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී හෙළිදරව් විය. විස්තර පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ලේඛන අප විසින් නඩත්තු කරනු ලැබේ.නමුත් ඇතැම් ශාඛාවල තොරතුරු යාවත්කාලීනව නොපැවතුණි. ඒවා දැන් නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් කර ඇති පරිදි රජයේ ගොඩනැගිලිවල පවතින සියළුම විදුලි උපකරණ සම්බන්ධයෙන් භාණ්ඩ ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ii) | **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | ඔබ විසින් සඳහන් කළ ලේඛනය යාවත්කාලීන කර ලේඛනගත කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් නඩත්තු කළ යුතුය. |

(ඉ) **නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

නියැදි විගණනයේදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | රු. මිලියන | | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | 1.18 | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාණ්ඩ හා සේවාවන් ලැබීමට පෙර අනුමත සමිතිවලට අතුරු අග්‍රිම අත්තිකාරම් ලබා දී තිබුණි. | අනුමත සමිති මූලා දුෂ්කරතාවයන්ව ලට මුහුපෑම සහ සමිති පසුගිය කාලවල ඔවුන් ලබාගත් කාර්යයන් විධිමත් ආකාරයෙන් නියමිත කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ කර සහයෝගය දීමත් සැලකිල්ලට ගනිමින් අත්තිකාරම් ලබා දී ඇත. | |
| (ii) මුදල් රෙගුලාසි571 | 7.67 | වර්ෂ 02 ක් ඉක්ම වූ ඇප තැන්පතු 26ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඇප තැන්පතු 26න් 02ක් හැර අනෙකුත් ඒවා නිරවුල් කර ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

\

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 137 හා 138 | 55.35 | භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමට ප්‍රථම 2019 වර්ෂයේදි චෙක්පත් 158 ක් ලියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක් විසින් ආරක්ෂිතව තබා තිබුණි.කළින්ම ලබාදුන් මෙම චෙක්පත් සඳහා 2020 මාර්තු 31 දින වන විටත් භාණ්ඩ ලබා ගෙන නොතිබූ අතර මාරු නොකළ චෙක්පත් ලැයිස්තුවේ දක්නට විය. | භාණ්ඩ හා සේවාවන් ඉක්මනින් ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව භාණ්ඩ හා සේවාවන් ලබාගත් පසුව චෙක්පත් ලිවිය යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 113 | 2.08 | වර්ෂ 18 ක සිට 32 දක්වා පරාසයක කාලයක සිට විවිධ කාරණා හේතුවෙන් එකතුව රු.මිලියන 2.08 ක් වූ පාඩු, මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ගිණුම්වල ගැලපීම් සිදුකර හෙලිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වටිනාකම කපාහැරීමට අඛණ්ඩව අමාත්‍යාංශයට අයදුම් කරමින් තිබේ. | මුදල් රෙගුලාසි 113 අනුව කටයුතු කළ යුතුය. |
| (v) | මුදල් රෙගුලාසි 94 | 1.30 | මූල්‍ය ප්‍රකාශවයල ඉදිරිපත් කර ඇති බැරකම් පිළිඳව ස්වාධීන සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි මේ සම්බන්ධයෙන් වැඩි අවධානක් යොමු කෙරේ. | මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඊ) වංචනික ස්වරූපයෙන් වූ ගනුදෙනු**

---

නියැදි විගණනය පරීක්ෂාවේදී නිරීක්ෂණය වු වංචනික ස්වරූපයෙන් ගනුදෙනු සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරවෙට්ටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයේ | විගණන නිරීක්ෂණයෙන් පසුව දේශීය | එකතු කල අගය මත බදු ආදායම් ගෙවීම් සිදු කරන සෑම |

| | | |
|---|---|---|
| III අදියර සඳහා බිල්පත්‍ර 2019 දෙසැම්බර් 26 දින ඉදිරිපත් කර තිබූ අතර මෙම කාර්යය සඳහා ගෙවීම් එකතු කළ අගය මත බදු (VAT) රු.473,083ක් සහිතව 2020 පෙබරවාරි 28 දින සිදු කරන ලදි. කෙසේවෙතත්, VAT සඳහා ගෙවීම කොන්ත්‍රාත්කරුගේ VAT අංකය අක්‍රියව පැවැති අවස්ථාවේදි සිදුවී තිබුණි. | දෙපාර්තමේන්තුවට අදාල එකතු කළ අගය මත බදු ගෙවා නිරවුල් කරන ලදි. | අවස්ථාවකදීම එහි ක්‍රියාකාරී තත්ත්වය (Active) තහවුරු කරගත යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 10,415.56ක් භාණ්ඩාගාරයෙන් අග්‍රිම සඳහා ඉල්ලුම් කර තිබුණි.නමුත් රු. මිලියන 8,590.99ක අග්‍රිම නිදහස් කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 1,824.57ක් සැලැසුම් කළ ආකාරයට වඩා අඩුවෙන් අග්‍රිම මුදල් ලබාදුන් හෙයින් පාර්ලිමේන්තුව විසින් සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකි වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලැසුම් කළ ව්‍යාපෘතීන්වල අවසන් අදියර ලඟාකර ගත නොහැකි වී තිබුණි. | අපගේ ඉල්ලීමට සරිලන අග්‍රිම භාණ්ඩාගාරයෙන් අප වෙත නිදහස් කර නොතිබුණි. මේ නිසා පාර්ලිමේන්තුවෙන් සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකිවී තිබූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සැලැසුම් කළ ව්‍යාපෘතීන්වල අවසන් අදියරද ලඟාකර ගත නොහැකි වී තිබුණි. | අග්‍රිම නියමිත කාලය තුළ ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පුනරාවර්තන වියදම්වලින් අවස්ථා 05 කදි වැය විෂයයන් 05 ක් යටතේ එකතුව රු.මිලියන 13.62 ක් ද මූලධන වියදම්වලින් අවස්ථා 11 කදි වැය විෂයයන් 08 ක් යටතේ එකතුව රු.මිලියන 1,806.77 ක් ද වටිනා ව්‍යාපෘති කාර්යයන් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබූ නමුත් භාණ්ඩාගාරයෙන් සමාලෝචිත වර්ෂය සඳහා අග්‍රිම මුදල් නොලැබීම නිසා ඒ සඳහා වූ ගෙවීම් සිදුකළ නොහැකි වී තිබුණි. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් නිදහස් කළ ප්‍රතිපාදන අනුව කාර්යයන් අවසන් කර ඇත.නමුත්, ඒ සඳහා අක්මුදල් භාණ්ඩාගාරායෙන් නොලැබී තිබූ බැවින් ඒ සඳහා ගෙවීම් සිදු කළ නොහැකි වි ඇත. | වියදම් සිදුකිරීමට ප්‍රථම අග්‍රිම ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම්, මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම්, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් මූල්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම් සහ උපයෝජනය ඉතිරි කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------- | -------------------- |
| (අ) | පුනරාවර්තන වියදම්වල මූලික ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 10 කින් සියයට 6.25 සිට සියයට 48.31 දක්වා පරාසයක ඉතිරි කිරීම් එකතුව රු.මිලියන 7.92 ක් පැවැතුණි. එසේම, වෙනත් වැය විෂයයන් 6ක සියයට 13.44 සිට සියයට 46.15ක් දක්වා පරාසයකින් එම වටිනාකම්න්ම අතිරික්තයක් ඇති වී තිබුණි. මෙය පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු විධිමත්ව සැලසුම් නොකිරීමෙන් සිදු කළ බවට හෙළිදරව් කෙරිණි. | මෙවැනි විෂයයන් කෙරෙහි ඉදිරි කාලයේදි වැඩි අවධානයක් යොමුකරන බවත් ඇස්තමේන්තු හා තථ්‍ය වියදම් අතර විචලනයන් අවම පරාසයකින් පවත්වා ගෙන යාමට අප විසින් කටයුතු කරනු ලැබේ. | පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු විධිමත්ව සැලසුම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | පුනරාවර්තන වියදම්වල මූලික ප්‍රතිපාදනයෙන් වැය විෂයයන් 10 කින් සියයට 6.25 සිට සියයට 48.31 දක්වා පරාසයක ඉතිරි කිරීම් හේතුවෙන් සිදුවූ මාරු කිරීම් සඳහා සතුටුදායක හේතු ඉදිරිපත් කර නොතිබුණි. | මාරුකිරීම් සඳහා හේතු අප විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ අතර එම හේතුවලින් වූ සෑහීමට පත්වීම මගින් අමාත්‍යාංශයේ ලේකම්වරයා අප වෙත මාරු කිරීම් සඳහා අනුමැතිය ලබාදී තිබුණි. | පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු විධිමත්ව සැලසුම් කිරීමට කටයුතු කළ යුතුයි. ඉතිරිකිරීම් සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කළ යුතු වේ. |
| (ඇ) | 2019 සැප්තැම්බර 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍ර ලේඛය ප්‍රකාරව, සමලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා සියයට 10ක ඉතිරිකිරීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂය වන 264 සඳහා අප විසින් සියයට 10ක ඉතිරියක් පෙන්වා තිබුණි. නමුත්, වෙනත් අමාත්‍යාශ සහ දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවල අමාත්‍යාශ හා දෙපාර්තමේන්තු විසින් සියයට 10ක ඉතිරිය සලසා තිබූ ප්‍රතිපාදිත අරමුදල් හැර අනෙකුත් අරමුදල් පමණක් අප වෙත නිදහස් කිරීම නිසා අපට මූලධන වියදම් සඳහා සියයට 10ක ඉතිරියක් නිරූපනය කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවීය. | අවසන් වූ කාලපරිච්ඡේදයේ සමානුපාතිකයට අනුකූලව මූලධන වියදම් සිදු කිරීම ගණනදීමේ නිලධාරීන් තහවුරු කරගැනීම මගින් චක්‍රලේඛ ප්‍රකාර ඉතිරි කිරීම් සිදු කළ හැකිවේ. |
| (ඈ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුනරාවර්තන වියදම් 06ක එකතුව රු. මිලියන 1.22ක නිරවුල් කළ යුතු බැරකම් පැවැති නමුත්, ඒ සඳහා සමාලෝචිත වර්ෂ ඉතිරිකිරීම් ලෙස එකතුව රු. මිලියන 0.03ක් පමණක් පැවැතිමෙන් රු. මිලියන | ඇතැම් වැදගත් සහ ඇස්තමේන්තුවට අභියෝගාත්මක ස්වරූපයේ වියදම් විෂයයන් සඳහා ප්‍රතිපාදිත වටිනාකමට වඩා අමතර ප්‍රමාණයක වියදම් | නිරවුල් නොකළ බැරකම් ලෙස දක්වන වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් බව ගණන් දීමේ නිලධාරි තහවුරු කරගත යුතුවේ. |

| | | |
|---|---|---|
| 1.19ක අතිරේක වියදමක් ඇතිවී තිබුණි. | දැරීමට අනුමත කර තිබුණි. මෙවැනි වියදම් විෂයයන්වල ගෙවීම් වැඩිවීම හේතුවෙන් සැලසූ ප්‍රතිපාදනයට වඩා වැඩි අගයක් බැරකම් ලෙස දැක්වීමට සිදුවිය. ඉදිරි කාලයේදි මෙවැනි විෂයන් සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන බව ඔබ වෙත දන්වා සිටිමි. | |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 39 ක් විසින් එකතුව රු.මිලියන 11,179.21 ක මුලා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණි. එම මූලා ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 8,969.33 ක් වැයකර තිබුණි. රු.මිලියන 2,209.87 ක් හෙවත් සියයට 14 ක් සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කර නොතිබුණි.

## 2.4 අත්තිකාරම් ගෙවීම් හා නිරවුල් කිරීම්

අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම් පිළිබඳ හෙළිදරව් කළ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවස්ථා 02 කදී ලබාදුන් අත්තිකාරම් එකතුව රු.150,837 ක් මාස 01 සිට මාස 04 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබූ බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබීම සහ අත්තිකාරම් ලබාගැනීමෙන් පසුව ඒවා අඛණ්ඩව ප්‍රතිපූර්ණය කිරීමේ පදනමින් භාවිතා කිරීම වැනි හේතු නිසා ප්‍රමාදවී නිරවුල් කර තිබුණි. | මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 තැන්පතු ශේෂ

තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් හෙළිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙවන පාර්ශවයට ආපසු ගෙවිය යුතු තාවකාලික තැන්පතුවල එකතුව රු.මිලියන0.69 ක් මාස 06 කට අධික කාලයක සිට අදාළ පුද්ගලයන්ට ලබා නොදී තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ගාස්තු සහ එහි පරිපාලන වියදම්වලට අදාල තැන්පත් සම්බන්ධිත ඒවා හැර අනෙකුත් දෑ දැනට නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | අදාළ තාවකාලික තැන්පතු මුදල් නියමිත කාලය ඇතුළත අදාළ පුද්ගලයන්ට ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වියදම් ප්‍රේෂණය සඳහා ලැබී තිබූ එකතුව රු.මිලියන 37.9 ක් මාස 06කට අධික කාලයක සිට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ගාස්තු සහ එහි පරිපාලන වියදම්වලට අදාල තැන්පත් සම්බන්ධිත ඒවා හැර අනෙකුත් දැ දැනට නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | අදාල මුදල් එම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වියදම් ගිණුමට හර කර ඇති නිසා ඒවා රජයේ වියදම් ලෙස ගිණුම් තබ ඇත. එලෙස ගිණුම්ගත කළ වටිනාකම තැන්පතු ගිණුමේ රඳවා තැබීමේදි ඒවාට වගකිව යුතු නිලධාරියා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 සහ 8.2 වගන්තිවලට අනුව විනය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | උතුරු පළාත් සභාවට අයත් 2019 දෙසැම්බර් 31 දිනට වූ ආදායම් ශේෂවල එකතුව රු.මිලියන 13.61ක් අදාළ අමාත්‍යාංශවලට හෝ දෙපාර්තමේන්තුවලට නොයවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | අග්‍රිම නොලැබීම නිසා 2019 දෙසැම්බර් අවසානයේදි පළාත් සභාවට යැවිය යුතු අග්‍රිම මුදල් යැවීමට නොහැකි විය. දැන් නිරවුල් කර ඇත. | උතුරු පළාත් සභාවට අයත් ආදායම් නියමිත කාලයේ අදාළ දෙපාර්තමේන්තුවලට යැවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | වර්ෂ 2ක් ඉක්මවූ එකතුව රු. මිලියන 7.67ක ඇප තැන්පතු 26ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉහත තැන්පතු 26න් තැන්පතු 02ක් හැර අනෙකුත් ඒවා දැනට නිරවුල් කරමින් පවතී. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් සැලසුම් කිරීම හා හෙළිදරව් කරනු ලැබූ අනෙකුත් සැලසුම් පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එයට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක් විසින් ඉටුකළ යුතුව තිබූ ගම්පෙරළිය වැඩසටහන් 5259 කින් වැඩසටහන් 5220 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ අවසන් කර තිබුණි. මෙම වැඩසටහන් සඳහා එකතුව රු.මිලියන 2,711.25 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබූ අතර ඉන් | වර්ෂ අවසාන කාලපරිච්ඡේදයේ ඉහත මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබූ බැවින් වැඩසටහන් නිසි අයුරින් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බැවින් මූල්‍ය ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශයට ආපසු හරවා යවන ලදී. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

එකතුව රු.මිලියන 2,627.29 ක් උපයෝජනය කර තිබුණි. මෙම සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 83.96 ක් ඉතිරි වී තිබුණි.

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැවත පදිංචි කිරීමේ හා උතුරු පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍යාධාර මත කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ වඩමාරාච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුප්පිට් විවිධසේවා සමූපකාර සමිතියේ වී මෝල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් Colour Sorter Machine සහ Automatic Packing Machine පිළිවෙලින් රු.3,190,100ක් සහ රු.8,741,380ක් වටිනා යන්ත්‍ර හා උපකරණ දෙකම ප්‍රතිලාභියාගේ භාවිතයට උචිත නොවන අයුරින් ලබාදීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි වී තිබුණි. | සමූපකාර සමිති උසස් මට්ටමේ නියෝජිතයන් සමග පැවැති සාකච්ඡාව අනුව යන්ත්‍ර දෙකම භාවිතයට සුදුසු අයුරින් අළුත්වැඩියා කරලබාදෙන ලෙසට සැපයුම්කාර ආයතනයෙන් ඉල්ලීම් කරන ලදුව ඔවුන් විසින් ඉහත ඉල්ලීම පිළිගන්නා ලදි. නමුත් ක්‍රියාත්මක කිරීමේදි ආයතනය කාලය ප්‍රමාද කිරීම නිසා ලබාදිය යුතු ගෙවීම් ගෙවා නිරවුල් නොකර රාජ්‍ය ආදායමට මාරුකිරීමට කටයුතු කරමින් පවතී. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත්ව සැලැසුම් කිරීම සහ තාක්ෂණික ඇගයීමත් සිදුකිරීම මගින් ඒවා සාර්ථක කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. උචිත නොවන යන්ත්‍ර සැපයීමේදි ඒවා ආපසු හරවා යවා සුදුසු ඒවාම ලබාගත යුතුවේ. |
| (ආ) | 2018 අයවැය සැලැස්මට අනුව නැවත පදිංචි කිරීමේ හා උතුරු පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍යාධාර මත කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ පන්ඩතරිප්පු ස්වදේශීය බෙහෙත් නිෂ්පාදනය, විකිණීම සහ වෛද්‍ය සේවා මධ්‍යස්ථානයට ලබාදුන් එකතුව රු. මිලියන 6ක් වටිනා යන්ත්‍රෝපකරණ නිෂ්පාදනයට සුදුසු නොවන අයුරින් ලබාදීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | ඔබ විසින් සඳහන් කළ යන්ත්‍රෝපකරණ විදේශීය රටකින් අදාල ආයතනය විසින් ලබාගැනීමෙන් පසුව අප වෙත ලබාදී තිබුණි. අප විසින් ලබාදුන් විස්තර සටහන් සහ ගබාගත් යන්ත්‍රවල ඵලදායිතාවය අතර සුළු වෙනස්කම් පවතී. මේ හේතුවෙන් අප විසින් චෙක්පත් ලබාදී නොමැත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත්ව සැලැසුම් කිරීම සහ තාක්ෂණික ඇගයීමත් සිදුකිරීම මගින් ඒවා සාර්ථක කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. උචිත නොවන යන්ත්‍ර සැපයීමේදි ඒවා ආපසු හරවා යවා සුදුසු ඒවාම ලබාගත යුතුවේ. |
| (ඇ) | J/46, කාරෙයිනගර් උතුර, කාරෙයිනගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන (RIDP) සහ කඩිනම් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන (RRDP) යටතේ ආලංකන්ඩි ක්‍රිඩාපිටිය සඳහා ගොඩනැගිල්ල රු.1,980,000ක පිරිවැයකින් ඉදිකර | වර්තමානයේ රටෙහි පවතින සෞඛ්‍ය වෛරස් ආසාදන සම්බන්ධ දුෂ්කර වාතාවරණය හේතුවෙන් සුළු කාලයක් මෙම ක්‍රිඩාපිටිය භාවිතා කළ නොහැකි විය. වර්තමානයේ ඉලන්ජෝලෙයි ක්‍රිඩා සමාජය විසින් භාවිතා කරති. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතයට සුදුසු ආකාරයට පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | තිබුණත්, ක්‍රීඩාපිටියේ කාර්යයන් සම්පූර්ණ නොකිරීමෙන් මේ දක්වා ගොඩනැගිල්ල ප්‍රයෝජන ලබන්නන් විසින් භාවිතා කර නොතිබුණි. | | |
| (ඇ) | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රැකියා සොයන්නන්ට පුහුණුව ලබාදීමේ අරමුණින් SMART Sri Lanka ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 13.75ක වටිනාකමින් 2019 ජූලි 11 දින ක්‍රියාත්මක කළ වැඩසටහනට අනුව ඉදිකළ ගොඩනැගිල්ල සහ උපකරණ අදාල අවශ්‍යතා සඳහා මේ දක්වා භාවිතා කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් සහ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් නොලැබීම නිසා ගොඩනැගිල්ල අදාල අරමුණ සඳහා භාවිතා කළ නොහැකි විය. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතයට සුදුසු ආකාරයට පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඉ) | J/376, නෙල්ලියඩි ග්‍රාම සේවා වසමේ කඩිනම් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති (RRDP) 2019 වැඩසටහන යටතේ නෙල්ලියඩි ප්‍රජාමූල මධ්‍යස්ථාන (NCC) ක්‍රිඩා සමාජය සඳහා රු.970,000ක ඇස්තමේන්තුගත වටිනාකමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණත් මෙය ප්‍රයෝජනයට ගනු ලබන පිරිස මේ දක්වා භාවිතා කර නොතිබුණි. | ගොඩනැගිල්ල සඳහා මූල්‍ය ප්‍රතිපාදන මුළුමනින්ම නොලැබී කොටසක් පමණක් ලැබී තිබුණි. අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ලැබූ අවස්ථාවක කාර්යයන් මුළුමනින්ම අවසන් කර අදාල අරමුණු සඳහා භාවිතා කරනු ලැබේ. | නිෂ්කාර්යව පවතින වත්කම් භාවිතයට සුදුසු ආකාරයට පත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 3.3 සැලසුම් නිමකිරිමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැවත පදිංචි කිරීමේ හා උතුරු පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍යාධාර මත කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුප්පිටි විවිධසේවා සමූපකාර සමිතියේ හාල් මෝල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් එකතුව රු.12,116,860ක් වටිනා යන්ත්‍ර හා උපකරණ මාස 03ක කාල ප්‍රමාදයකින් පසුව 2019 ජූනි 27 දින ලබාදී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහ උපකරණ පිටරටින් ආනයනය කර අදාල ආයතනය විසින් ලබදීම නිසා සිදුවූ ආනයන ක්‍රියාවලිය හේතුවෙන් ප්‍රමාදය සිදු වී තිබුණි. | සැපයුම්කරුවන් වෙත මිලදී ගැනුම් ඇණවුම් කිරීමේදි කොපමණ කාලයක් ඇතුළත භාණ්ඩ ලබාදී සම්පූර්ණ කළ යුතුද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවේ. ප්‍රමාදයන් සිදු වීමේදි ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකළ යුතුවේ. |
| (ආ) | වලිකාමම් නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. මිලියන 21.87කින් ඉදිකළ සංස්කෘතික මධ්‍යස්ථානය 2017 දෙසැම්බර් 31 දින වැඩ අවසන් | වර්තමානයේ දඩ ගාස්තු අයකර ඇත. | වැඩසටහන් නියමිත කාලය තුළ නිම කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානය යොමුකළ යුතු අතර කාල ප්‍රමාදය සඳහා දඩ |

| | | | |
|---|---|---|---|
| | කළ යුතු වුවත්, මාස 06ක කාල ප්‍රමාදයකින් පසුව එහි වැඩ අවසන් කර තිබුණි. එසේම කාල ප්‍රමාදය සඳහා දඩ ගාස්තු රු. 247,380ක් කොන්ත්‍රාත් ගිවිසුමේ අංක 6.4 ඡේදය ප්‍රකාරව අයකරගෙන නොතිබුණි. | | ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | මරුදන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. මිලියන 16.78 මධ්‍යම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කාර්යය 2018 මාර්තු 31 දින අවසන් කළ යුතුව තිබුණත්, මාස 09ක් ප්‍රමාදයකින් පසුව 2018 දෙසැම්බර් 26 දින අවසන් කර තිබුණි. එසේම කාල ප්‍රමාදය සඳහා දඩ ගාස්තු ලෙස රු.251,770ක් ගිවිසුම් කොන්දේසි අංක 6.4 ඡේදය ප්‍රකාරව අයකර නොතිබුණි. | වර්තමානයේ දඩ ගාස්තු අයකර ඇත. | වැඩසටහන් නියමිත කාලය තුළ නිම කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානය යොමුකළ යුතු අතර කාල ප්‍රමාදය සඳහා දඩ ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | නැවත පදිංචි කිරීමේ හා උතුරු පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍යාධාර මත කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පළතුරු වගාකරුවන් විකිණීමේ විවිධ සේවා සමුපකාර සමිතියට පලතුරු බීම නිෂ්පාදනයට අදාල රු.6,757,745ක් වටිනා යන්ත්‍ර මාස 11ක කාල ප්‍රමාදයකින් පසුව 2019 දෙසැම්බර් 25 දින ලබා දී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා යන්ත්‍ර සහ උපකරණ පිටරටින් ආනයනය කර අදාල ආයතනය විසින් ලබදීම නිසා සිදුවූ ආනයන ක්‍රියාවලිය හේතුවෙන් ප්‍රමාදය සිදු වී තිබුණි. නමුත්, නියමිත කාලය තුළ ලබාදීමේදි ඉහත ආයතනය අපොහොසත්වීම නිසා ආයතනයට ලබාදිය යුතු අවසන් ගෙවීම, ගෙවා නිරවුල් නොකර රජයේ ආදායමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත්ව සැලැසුම් කිරීම සහ |
| (ඉ) | වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම්කාර්යාල කොට්ඨාශයේ J/225, කොල්ලන්කලට්ටි ග්‍රාම සේවා වසමේ (Power Loom) විදුලි බලවේග යන්ත්‍ර මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය සහ යන්ත්‍ර මිලදි ගැනිම සම්බන්ධයෙන් එකතුව රු. මිලියන 8.32ක් ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි. නමුත්, ඒවා මේ දක්වා අදාල අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | ඉදිකිරීම් කාර්යයේ සිදුවූ ඇතැම් අඩුපාඩු කොන්ත්‍රාත්කරුට අනාවරණය කිරීමෙන් ඔහු විසින් අඩුපාඩු නිවැරදි කරදීමේදි කාල ප්‍රමාදයක් සිදුවිය. දැනට උතුරු පළාත් කම්කරු දෙපාර්තමේන්තුවේ පුහුණු කළ කාර්ය මණ්ඩලය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත්ව සැලැසුම් කිරීම සහ තාක්ෂණික ඇගයීමත් සිදුකිරීම මගින් ඒවා සාර්ථක කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. උචිත නොවන යන්ත්‍ර සැපයීමේදි ඒවා ආපසු හරවා යවා සුදුසු ඒවාම ලබාගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වාවකච්චේරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ වී ගබඩාව ඉදිකිරීමේ කාර්යය 2018 ඔක්තෝබර් 02 දින අවසන් විය යුතුව තිබුණත්, මාස 09ක කාල ප්‍රමාදයකින් පසුව 2019 අගෝස්තු 08 දින අවසන් කර තිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීමේ මූල ද්‍රව්‍ය ලබාගැනීමේදි සිදුවන කාල ප්‍රමාදයන් සහ වර්ෂ අවසානයේ වූ කාලගුණික වෙනස්වීම් නිසාත් නියමිත වේලාවට අවසන් කළ නොහැකි තත්ත්වයක් උදාවිය. වර්තමානයේ ප්‍රතිශෝධිත කර ඇත. | ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් නියමිත කාලය තුළ අවසන් කිරීම සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ යුතුවේ. |

**3.4 ප්‍රසම්පාදනය**

-----------------

මේ සම්බන්ධයෙන් හෙලිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ---------------- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවාවන් ලබාගැනීම සඳහා රු.මිලියන 76.8 ක මුදල් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ඉන් රු. මිලියන 65ක් වැය කර තිබුණි. සලසා තිබූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කළයුතු ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.<br><br>ප්‍රසම්පාදන සැලසුම් සහ ආරම්භක අවධිය<br>---------------------------------- | | |
| | මෙම අවධිය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සහ ලිපි ලේඛන පිළියෙල කර නොතිබුණි. | ඔබගේ උපදෙස් හා මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදන පැකේජයේ සාරාංශය, ආරම්භක ප්‍රසම්පාදන සැලැස්ම ආදිය 2018 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලේඛන පිළියෙල කරන බවට ගණන් දීමේ නිලධාරි සනාථ කළ යුතුවේ. |
| (i) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම | | |
| (ii) | ප්‍රසම්පාදන පැකේජයේ සාරාංශය | | |
| (iii) | ආරම්භක ප්‍රසම්පාදන සැලැස්ම | | |
| (iv) | හඳුනා ගනු ලැබූ ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් විශේෂ අනුමැතිය ලබාගැනීම. | | |
| (v) | නිර්දේශයන්, සැලසුම් කිරීම්, සටහන්, ඉදිකිරීම් ආදියෙහි සංවර්ධනය | | |

| | | |
|---|---|---|
| (ආ) පූර්ව කොන්ත්‍රාත් අවධිය<br>----------------------------<br>මෙම අවධිය යටතේ පිළියෙල කළ යුතු ලිපි ලේඛන සහ ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ. | සෑම ප්‍රසම්පාදනයකටම පූර්ව අවධියේ අප විසින් සම්බන්ධිත සියළුම ලිපි ලේඛන සකස් කර තිබුණි. නමුත් ඇතැම් ලේඛන සකස් කිරීමේ අවශ්‍යතාවය සහ අවස්ථාවන් ඇති නොවූ බැවින් ඒවා පිළියෙල කර නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ සිට ඒවා පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලිපි ලේඛන සකස් කර ඇමිණීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (i) එක් එක් ගිවිසුම් පැකේජ සහ ප්‍රසම්පාදන උප කාලසටහන(ප්‍ර. කා)<br>(ii) කාර්යයන්, භාණ්ඩ සහ සේවා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම<br>(iii) උපදේශාත්මක සේවා සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම්<br>ඉහත සඳහන් පරිදි සැලසුම් සකස් කර නොතිබුණි. | | |
| (ඇ) කොන්ත්‍රාත්වලින් පසුව අවධිය (කොන්ත්‍රාත් පරිපාලන අවධිය)<br>-----------------------------------<br>මෙම අදියර යටතේ පිළියෙල කළ යුතු පහත සඳහන් ලිපිලේඛන හා ව්‍යාපෘති පිළිබඳ සැලසුම් සකස් කර නොතිබුණි.<br>(i) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම(කො. ප)<br>(ii) කොන්ත්‍රාත් පරිපාලන සැලැස්ම සමඟ සංයෝජිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය | එක් එක් ප්‍රසම්පාදන පසු අවස්ථාවේදීම අප විසින් සම්බන්ධිත සියළුම ලිපි ලේඛන ගෙවීම් කිරීමේ අවශ්‍යතාවය සඳහා සකසනු ලැබේ. නමුත් ඇතැම් ලිපි ලේඛන සකස් කිරීමේ අවශ්‍යතාවය සහ අවස්ථාවන් ඇති නොවූ බැවින් ඒවා පිළියෙල කර නොතිබුණි. නමුත් 2018 වර්ෂයේ සිට ඒවා පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලිපි ලේඛන සකස් කර ඇමිණීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>ජංගම නොවන වත්කම් නිෂ්කාර්යව සහ ඌන උපයෝජිතව පැවතුණි. විස්තර පහත දැක්වේ.
<table>
<tr><th></th><th>වත්කම් වර්ගය</th><th>ඒකක ගණන</th><th>වටිනාකම</th><th>ඌන උපයෝජිතව පැවති කාලය</th></tr>
<tr><td></td><td></td><td></td><td>රු.</td><td>වර්ෂ</td></tr>
<tr><td>(අ)</td><td>ගොඩනැගිලි</td><td>02</td><td>14.72</td><td>1</td></tr>
<tr><td>(ආ)</td><td>යතුරු පැදි</td><td>11</td><td>8.69</td><td>3-9</td></tr>
<tr><td>(ඇ)</td><td>පිරියත හා යන්ත්‍ර</td><td>06</td><td>1.24</td><td>3-5</td></tr>
<tr><td>(ඈ)</td><td>කාර්යාල උපකරණ හා ලී බඩු</td><td>150</td><td>0.44</td><td>3</td></tr>
</table></td>
<td>ගොඩනැගිලි වර්තමානයේ ඵලදායීව භාවිතා කිරීමේ අරමුණින් ක්‍රියාමාර්ග ගනිමින් පවති. යතුරුපැදිවල අයිතිය පළාත් සභාව සතුය. මේවායේ අයිතිය මාරු කිරීමේ කාර්යයන් දිස්ත්‍රික් ලේකම් මඟින් සිදු කෙරේ. බෝට්ටු 06 ක් දැනට ප්‍රාදේශීය සභාව - වේලනෙයි වෙත පවරා දී ඇත. ආරක්ෂිත කබා 150 ක් ඌන උපයෝජිතව පැවතුණි. දැනට ප්‍රාදේශීය සභාව - වේලනෙයි වෙත භාර දී ඇත.</td>
<td>1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 සහ 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්කාර්යව සහ ඌන උපයෝජිතව පවතින වත්කම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.</td></tr>
</table>

## 3.6 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් හෙළිදරව් කරනු ලැබූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාල නව පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ රු. මිලියන 4.56ක පිරිවැයකින් ඉදිකළ විදුලි සෝපානය සඳහා වාර්ෂික නඩත්තු සේවා සඳහා රු. 207,000ක් වැය කරන නමුත් නඩත්තු සේවා ගිවිසුමේ සඳහන් පරිදි නඩත්තු සේවා කටයුතු සිදු නොවීම හේතුවෙන් නිතරම අක්‍රිය වී අඛණ්ඩව මාස 03ක කාලයක් නිෂ්කාර්යව | අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබේ. | නඩත්තු ගිවිසුම් කොන්දේසි අනුව සේවා සැපයුම්කරුගෙන් ඵලදායි සේවාවක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

පැවතුණි. මේ සම්බන්ධයෙන් ප්‍රතිශෝධිත කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන දිස්ත්‍රික් ලේකම්කාර්යාලය විසින් මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන අනුව දිස්ත්‍රික්කය තුළ ඇප තැබිය යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක නිලධාරින් 04දෙනෙකු විසින් ඇප නොතැබීම නිසා ඔවුන්ගේ අඩුපාඩු හේතුවෙන් සිදුවිය හැකි පාඩු හිලව් කරගත ආකාරයෙන් පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස ක්‍රියාකිරීමට දිස්ත්‍රික් ලේකම්වරයා අපොහොසත් වි තිබුණි. | ඔබ විසින් අනාවරණය කරන ලද කරුණු දැනට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන අනුව ඇප තැබිය යුතුය. |

**3.8 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 18 සිට 32ක් දක්වා කාල පරාසයක දක්වා විවිධ හේතු නිසා එකතුව රු. මිලියන 2.08ක් පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ගිණුම්වල නිවැරදි කර පැහැදිලි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක HA/F/01/CIRCULARS/Gen දරන 2019.04.02 දිනැති ලිපිය මගින් රු. 250,000ක් ඇතුළත පාඩු කපා හැරීමට දිස්ත්‍රික් ලේකම්වරයාට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.116,634ක් සහ තෙල්ලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.209,945ක් කපා හැර ඇත. අපගේ අංක JK/SW/Loss/V/162/18 දරන 9019.05.02 දිනැති ලිපිය ප්‍රකාරව චාවකච්චේරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.16,016,959ක් සහ | මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ගිණුම්වල නිවැරදි කර පැහැදිලි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | සංගානෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.459,850ක් කපා හැරීමට අනුමැතිය අමාත්‍යාංශයෙන් ලබාදී නොතිබුණි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කාරෙයිනගර් සහ වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ධාවනයේ පැවැති වාහන දෙකක් අනතුරට පත්වීම හේතුවෙන් සිදු වූ අලාභ පිළිවෙලින් රු.448,550 ක් සහ රු.21,400ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කාරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන අනතුරු අලාභය කපාහැරීම සඳහා අනුමැතිය අමාත්‍යාංශයෙන් ලබාගැනීමට කටයුතු කරමින් පවති. වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන අනතුරෙහි අලාභය රු.21,400ක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. | වාහනවලට සිදුවන අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 සිට 109 දක්වා වූ විධිවිධාන අනුගමනය කළ යුතුවේ. එසේම, අනෙකුත් අලාභ මූල්‍ය ප්‍රකශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.9 අනාර්ථික ගනුදෙනු

**ඉහත කරුණ සම්බන්ධයෙන් අනාවරණය කරන ලැබූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිරිපස තිබෙන ස්වයංක්‍රීය දොරටුව ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේ රු. මිලියන 1.28ක් වැය කර තිබුණත්, ඉහත ස්වයංක්‍රීය දොර මේදක්වා අදාල අවශ්‍යතා සඳහා භාවිතා කර නොතිබුණි. | වැඩි වූ විදුලිය වියදම පාලනය කිරීමේ අරමුණින් ස්වයංක්‍රීය දොර සීමා සහිතව අප විසින් භාවිතා කරනු ලැබේ. | මෙවැනි අනවශ්‍ය වියදම් අනාගතයේදි වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 4. තිරසාර අරමුණු ළඟාකර ගැනීම

ඉහත කරුණ සම්බන්ධයෙන් අනාවරණය කරන ලැබූ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෑම රජයේ ආයතනයක්ම තිරසාර සංවර්ධන ඉලක්ක එක්සත් ජාතීන්ගේ රටවල් සඳහා වැඩසටහන් 230 න්‍යාය පත්‍රයට අනකූලවත් 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත අනුගමනය කර | ජාතික මට්ටමින් හඳුනාගත් ක්‍රියාත්මක කිරීමට ඇති තිරසාර සංවර්ධන ඉලක්ක දිස්ත්‍රික් මට්ටමින් ළඟාකරගැනීම සඳහා කාලයෙන් කාලයට | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛවල සඳහන් ආකාරයට සැලසුම් සකස්කර කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |

ක්‍රියාත්මක කළ යුතු අතර චක්‍රලේඛ මගින් ඉහත කරුණු සම්බන්ධයෙන් සියළුම රජයේ ආයතන විසින්ම දැනගෙන තිබුණි. එයට අනුකූලව සියළුම රජයේ ආයතන අදාල ආයතනයේ බලසීමාව යටතට ගැනෙන කාර්යයන් පිළිබඳව කෙසේ කටයුතු කළ යුතුද යන්න දැන සිටිය යුතුය. නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉහත කරුණු නොදැන සිටි බැවින් මෙහි කර්තව්‍යයන් සම්බන්ධ අරමුණු, ඉලක්ක සහ මෙම ඉලක්ක ළඟාකර ගැනීම මැනීම සඳහා අවශ්‍ය දර්ශක ආදිය හඳුනාගෙන නොතිබුණි.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ නියෝජිත ආයතන හරහා අප වෙත ලැබෙන උපදෙස් සහ මාර්ගෝපදේශ පදනම් කර ගනිමින් දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පවතී.

## 5. මානව සම්පත් කළමනාකරණය

2019 දෙසැම්බර් 31 දිනට පැවති අනුමත කළ, තථ්‍ය, පුරප්පාඩු සහ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 52 | 03 | - |
| තෘතියික මට්ටම | 64 | 30 | 35 | 01 |
| ද්විතියික මට්ටම | 1,134 | 1,062 | 77 | 05 |
| ප්‍රාථමික මට්ටම | 207 | 172 | 36 | 01 |
| එකතුව | **1,460** | **1,316** | **151** | **07** |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු 151ක් පිරවීමට හෝ අනුමත කළ සේවක සංඛ්‍යාව සුදුසු ආකාරයට පත්කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | සෑම රජයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීම්වලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යාපනය වෙනුවෙන් දිස්ත්‍රික් මට්ටමින් තවමත් සම්පූර්ණ නොකළ තනතුරු පුරප්පාඩු පිළිබඳව යෝජනා කර තිබුණි. එනමුත් පත්කිරීම් බලධරයන් විසින් අදාල පුරප්පාඩු පුරවා නොතිබුණි. | අනුමත සේවක පුරප්පාඩු පිරවීම සඳහා සේවක මණ්ඩල යෝජනා සැලැස්මක් අනුගමනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන ප්‍රාථමික, ද්විතියික සහ තෘතියික මට්ටම්වල නිලධාරීන්ගේ පැවති අතිරික්ත තනතුරු 07ක් අවශ්‍යතා පවතින ස්ථානවලට මාරු කිරීම සඳහා ක්‍රියාමාර්ග නොතිබුණි. | තොරතුරු තාක්ෂණ සහකාරවරයෙකුගේ පුරප්පාඩුව තොරතුරු තාක්ෂණ නිලධාරී විසින් ආවරණය කර ඇත.<br><br>සංවර්ධන නිලධාරීන් 05දෙනෙකු SMART Sri Lanka යන විශේෂ ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් පත්කර ඇත.<br><br>රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නඩත්තු කරන රජයේ නිවාස සඳහා භාරකරුවන් 02දෙනෙකුගේ තනතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාල අනුමත සේවක මණ්ඩලයට ඇතුලත් වේ. මෙම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. මේනිසා එක් තනතුරු පුරප්පාඩුවක් පමණක් පවතී. කෙසේ වුවත්, ඉහත කාරණා 2021 වර්ෂයේ ස්ථාන මාරු වීම් වලදී නිරවුල් කිරීමට කටයුතු කෙරේ. | අතිරික්ත සේවක මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා යෙදවීමට කටයුතු කළ යුතුවේ. |